# රහසිගත ලෙස අත්සන් කරන ලද ,

# ශ්‍රී ලංකා - සිංගප්පූරු ගිවිසුම

මුලින් ඉන්දු ලංකා සීපා ගිවිසුම නමිනුත් පසුව එට්කා ගිවිසුම නමිනුත්, ලංකාවේ සේවා ක්ෂේත්‍රය විවෘත කරමින් වෙළඳාමට පිවිසීම අප රටේ පුරවැසියන්ට අගතියක් සිදු කරන බව වෛද්‍ය, ඉංජිනේරු වැනි වෘත්තීය වේදීන් පමණක් නොව කරුණු අධ්‍යයනය කල සියලු දෙනා පෙන්වා දුනි. <u>රට වැසියා සුරක්ෂිත කරන ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් ලංකාවට නොමැත</u>. අප්‍රිකානු රටවලට පවා වෙළඳ ප්‍රතිපත්ති ඇත. නමුත් කවුරු විරුද්ධ වුනත් මෙම ගිවිසුම් අත්සන් කරන බව පවසන ජන නායකයන් අප රටේ ඇත. රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති බවද ඔවුන් කියති.

එට්කා අවධානම පෙන්වා දෙමින් තිබියදී, කාගේත් ඇස් වසා සිංගප්පූරු නිදහස් ගිවිසුම 2018 ජනවාරි අත්සන් කර එය රහසිගත ලෙස සගවා තිබුනි. ආර්ථික ගිවිසුම් සඳහා අනුමැතිය ලබා ගැනීමට ජනමත විචාරණයකට යා යුතු බව ඔබ කවුරුත් දනී. නමුත් අඩුම තරමේ පාර්ලිමේන්තුවටවත්, පක්ෂ නායකයින්ටවත් ඉදිරිපත් කිරීමකින් තොරව සිංගප්පූරු රහසිගත ගිවිසුම අත්සන් කර ඇත.

සිංගප්පූරු ගිවිසුම තොරතුරු දැන ගැනීමේ පනත යටතේ දිගින් දිගටම කරන ලද ඉල්ලීම හමුවේ MODSIT වෙබ් අඩවියේ www.modsit.gov.lk පල කර ඇත. එහි ඇති කරුණු අධ්‍යයනය කිරීමේදී අප මව් රට විදේශිකයන්ට පාවා දී ඇති බව මැනවින් තහවුරු වේ.

ගිවිසුමේ පළමුවැනි පරිච්ඡේදය අනුව වෙළඳාම සඳහා ලංකාවේ මුලු භූමිය පමණක් නොව එය මෙන් 8 ගුණයක් පමණ වූ අපට අයත් වාණිජ මුහුදත්, එහි මුලු අහස් තලයත්, විදේශිකයන්ට සීමා රහිතව විවෘත කර ඇත.

නමුත් සිංගප්පූරුව භූමිය විවෘත කර ඇත්තේ සිංගප්පූරු රජයට අයත් සම්පත් වලට සීමා පමුණුවමින්ය. සිංගප්පූරු මුහුදත් අහස් තලයත්, භූමියෙන් 90% ක් පමණ වූ ප්‍රදේශයත් රජයට අයත්ය. ව්‍යාපාර සඳහා අපට ඇතුල් විය හැක්කේ සිංගප්පූරු භූමියෙන් 10% ක්වූ වර්ග කිලෝමීටර 72 ක් වූ කුඩා බිම් ප්‍රමාණයකට පමනි.

වෙළදාම සඳහා ලංකාවේ සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා පුරවැසියන් පමනි. නමුත් සිංගප්පූරුවේ පුරවැසියන්ට පමණක් නොව, එහි (PR) හෙවත් නිත්‍ය නේවාසිකභාවය ගත් ඕනෑම විදේශිකයෙකුටත් ලංකා භූමියට ඇතුල් විය හැක. සිංගප්පූරුවේ නිත්‍ය නේවාසික සංඛ්‍යාව ඉතා විශාලය. ලෝකයේ සිංගප්පූරුව රටක් ලෙස හඳුන්වනවාට වඩා වෙළඳ පලක් ලෙස හඳුන්වන්නේ එබැවිනි. මේ අනුව ඕනෑම විදේශිකයෙකුට සිංගප්පූරු ගිවිසුම හරහා ලංකාවේ භූමිය, මුහුද සහ අහස් තලය සඳහා පිවිසීමට පැහැදිලි අර්ථ නිරූපනය නොකළ වෙළඳාම හරහා ඉඩදී ඇත.

1815 ගිවිසුමෙන් රටට ඇතුල් වීමට ඉඩ ලැබුවේ බ්‍රිතාන්‍ය සුද්දාට පමණි. නමුත් සිංගප්පූරු ගිවිසුම 1815 ගිවිසුම අභිබවා ගිය පාවා දීමක් බව ඔබට වැටහෙනු ඇත.

ගිවිසුම් සකස් කිරීමේදී රට වැසියා ආරක්ෂා කරන මූලධර්ම උල්ලංඝනය කර ඇත. ලෝක වෙළඳ සංවිධානයේ නිර්දේශ සියල්ල උල්ලංඝනය කර ඇත. රටේ පාර්ලිමේන්තුව ඇතුලු සියලු දෙනාට වසන් කර ඇත.

**මෙම භයානක ගිවිසුමෙන් බැහැර වීමේ ක්‍රමවේදයක් මෙම ගිවිසුමේ සඳහන් කර නැත. ගිවිසුම අවසන් වන කාලසීමාවද මෙහි සඳහන් ව නැත.**

**එබැවින් රට සදාකාලීන උගුලක සිර කර ඇති බවත්, එම උගුලට අවාසනාවන්ත ලෙස අප සියලු දෙනා අසු වී ඇති බවත් <u>www.modsit.gov.lk</u> වෙබ් අඩවියේ ඇති ගිවිසුම කියවීමෙන් ඔබට දැක ගත හැක.**

*රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය* **17.05.2018**